තොරතුරු මාසිකය

# විමර්ශන

**2025 නොවැම්බර්**
**ජනතා විමුක්ති පෙරමුණේ**
**අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි.**

**ලෝකය වෙනස් කිරීමට වෙනස් වෙමු!**

# අර්බුදයට විසඳුම ලෙස විදේශ ආයෝජන

**ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයට බලපෑ ප්‍රධාන සාධක අතුරින් එකක් වූයේ විදේශ විනිමය ගැටලුවයි. රටකට ලැබෙන විදේශ විනිමය අඩු වන විට එම රට ගෙවුම් ශේෂ ගැටලුවලට මුහුණ දෙන අතර, විදේශීය ගෙවීම් සඳහා විදේශ විනිමය නොමැති වීමෙන් අර්බුදය පැනනඟී.**

2022 මතුවූ ආර්ථික අර්බුදයට ප්‍රධාන සාධකය වූයේ මෙම විදේශ විනිමය නොමැති වීමයි. විශාල ණය පොලී සහ වාරික ප්‍රමාණයකුත්, කුඩා අපනයන ආදායමකුත්, ආනයන මත රඳාපවතින ආර්ථිකයකුත් පවතින කල එවැනි අර්බුද මතුවීම පුදුමයට කරුණක් නොවේ. එනිසාම වත්මන් රජයට පැවැති ප්‍රධාන අභියෝගය වූයේ මෙම අංශ කිහිපය සාර්ථකව කළමනාකරණය කරන්නේ කෙසේද යන්නයි. එම අභියෝගය ජය ගැනීම සඳහා ඇති ප්‍රධාන ක්‍රියාමාර්ග වූයේ විදේශ විනිමය ලැබීම් ප්‍රමාණය ඉහළ නංවා ගැනීමයි. ඒ සඳහා අපනයන ආදායම, විදෙස් ශ්‍රමික ප්‍රේෂණ, සංචාරක ආදායම ඉහළ නංවා ගැනීම සහ විදේශ ආයෝජන ලබා ගැනීමයි.

රැග්නර් නර්ක්ස් නමැති ආර්ථික විද්‍යාඥයාගේ තර්කයට අනුව දුගී බවේ විෂම චක්‍රය හට ගන්නේ රටක අඩු නිෂ්පාදනය නිසා අඩු ආදායමකුත්, අඩු ආදායම නිසා අඩු ඉතිරි කිරීමුත්, අඩු ඉතිරි කිරීම් නිසා අඩු ආයෝජනත්, අඩු ආයෝජන නිසා නැවත අඩු නිෂ්පාදනත් ආදී වශයෙන් ආර්ථිකය චක්‍රයක් ලෙස කැරකෙන නිසාය. මෙම චක්‍රයෙන් ගැලවීමට දුප්පත් රටකට ඇති එකම ක්‍රියාමාර්ගය වන්නේ ආයෝජන ඉහළ නංවා ගැනීමයි. රට දුප්පත් වීම හේතුවෙන් ආර්ථිකය බංකොළොත් වී තිබෙන එවැනි රටකට දේශීය ආයෝජන ඉහළ නංවා ගැනීම ප්‍රායෝගික නොවන නිසා එයට ඇති එකම ක්‍රියාමාර්ගය වන්නේ විදේශීය ආයෝජන ඉහළ නංවා ගැනීමයි. ඒ අනුව දුප්පත් රටක ආර්ථික අර්බුදයට ඇති ප්‍රධාන විසඳුමක් වන්නේ විදේශ ආයෝජන ඉහළ නංවා ගැනීමයි. ලංකාවේ ආර්ථික අර්බුදයට ඇති ප්‍රධාන විසඳුමක් ලෙස විදේශ ආයෝජන ඉහළ නංවා ගැනීම කොතරම් දුරකට සාර්ථකවී ඇතිද යන්න සලකා බැලිය යුතුය.

වගු අංක 01

| අංශය | දායකත්වයේ ප්‍රතිශතය |
|---|---|
| නිෂ්පාදන | 45% |
| යටිතල පහසුකම් | 22% |
| උපයෝගීතා සේවා | 16.5% |
| ඇගලුම් කර්මාන්තය | 7.3% |
| දැනුම සම්බන්ධ සේවා | 3.14% |
| සංචාරක ව්‍යාපාරය | 2.8% |
| කෘෂිකර්මය | 2.5% |

වගු අංක 02

| සෘජු විදේශ ආයෝජන ලැබීම් ඩොලර් මිලියන | | |
|---|---|---|
| අංශය | 2024 | 2025 |
| ජනවාරි - ජුනි දක්වා | 252 | 507 |
| ජූලි - සැප්තැම්බර් | 95 | 320 |
| එකතුව | 347 | 827 |

වගු අංක 03

| මුදල් වර්ගය | වර්ෂය | | | |
|---|---|---|---|---|
| | 2022 | 2023 | 2024 | 2025 |
| යුරෝ | 386.93 | 358.75 | 304.56 | 354.66 |
| පවුම් | 437.35 | 412.61 | 367.38 | 408.19 |
| එ.ජ.ඩොලර් | 363.11 | 232.92 | 292.58 | 302.00 |
| ඉන්දියන් රුපියල් | 4.39 | 3.90 | 3.42 | 3.42 |

ආණ්ඩුවට වසරක් ගත වන විට රටෙහි ආර්ථිකය ස්ථාවර කරගෙන ඇති අතර, සෘජු විදේශ ආයෝජන ලැබීම් බලපොරොත්තු වූවාට වඩා වැඩි ප්‍රමාණයක් ලැබී ඇත. 2025 වසර සඳහා ඇස්තමේන්තුගත විදේශ ආයෝජන ප්‍රමාණය ඩොලර් මිලියන 1,057ක් ලෙස වාර්තා කර ඇත. මෙම ආයෝජනය පහත අංශවලට දායක වන ආකාරයද පුරෝකථනය කර ඇත. එය පහත වගු අංක 01 පරිදි වේ:

ඉහත පුරෝකථනයන් මත ආර්ථිකය තුළ විශාල රැකියා අවස්ථා ප්‍රමාණයක් උත්පාදනය කිරීමටද බලාපොරොත්තු වේ.

රජය බලාපොරොත්තුවූ ඉහත පුරෝකථනයන්ට අනුව 2025 වසරේ පසුගිය මස නවය තුළ ලංකාවට ලැබී ඇති සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය පහත වගු අංක 02 පරිදි වේ.

ඉහත සංඛ්‍යාලේඛනයට අනුව සෘජු විදේශ ආයෝජන මාස නවයක් තුළ සියයට 138කින් ඉහළ ගොස් තිබේ. ඒ අනුව බලාපොරොත්තුවූ ප්‍රමාණයට වඩා සෘජු විදේශ ආයෝජන ආර්ථිකයට ලැබී ඇත. එය නිෂ්පාදන අංශයට සියයට 40.8 ක් ලෙසත්, වරාය සංවර්ධනයට සියයට 28ක් ලෙසත්, සංචාරක ව්‍යාපාරය සඳහා සියයට 11ක් ලෙසත් ලැබී තිබේ. ඒ අනුව රජය අපේක්ෂා කළ පරිදිම නිෂ්පාදන අංශය සඳහා වැඩි ආයෝජන ප්‍රමාණයක් ලැබී තිබේ.

එලෙසම විදේශ ආයෝජන, සංචාරක ව්‍යාපාරයේ ලැබීම්, විදෙස් ශ්‍රමික ප්‍රේෂණ, සහ අපනයන ආදායම යන අංශ හතරේ ඇතිවූ වර්ධනය මත යහපත් විදේශ විනිමය අනුපාත පවත්වාගෙන යාමට රජයට හැකි විය. විශාල ලෙස වෙනස් වන පුරෝකථනය කළ නොහැකි මට්ටමේ උච්චාවචනවලට භාජනය වන විනිමය අනුපාත ආර්ථිකයකට විශාල ගැටලු ගෙන දේ. එහෙත්, ඉහත අංශවල සැලැකිය යුතු වර්ධනය මත ස්ථාවර විනිමය අනුපාත වසර පුරාම පවත්වාගෙන යා හැකි වීම ආර්ථිකය තුළ අප ලද විශාල ජයග්‍රහණයකි. පසුගිය වසර කිහිපයෙහි රුපියලට සාපේක්ෂව විදේශ විනිමය අනුපාතවල හැසිරීම පහත වගු අංක 03 පරිදි වේ:

වසර 05ක් පමණ වාහන ආනයනය නොකර තිබියදී, ඒ වෙනුවෙන් වසරක් තුළ ඩොලර් මිලියන 1,000ක් පමණ වැය කර වාහන ආනයනය කිරීමෙන් පසුවද මෙවැනි අනුපාත නඩත්තු කිරීමට හැකි වීම ආර්ථික ස්ථාවරභාවය පැහැදිලි කිරීමට කදිම නිදසුන්ය.

# විෂ මත්ද්‍රව්‍ය මුලිනුපුටා දැමීමේ ‘රටම එකට’ ජාතික මෙහෙයුම

වර්තමානයේ රට මුහුණ දී තිබෙන ජාතික ව්‍යසනකාරී තත්ත්වයක් ලෙස විෂ මත්ද්‍රව්‍ය ජාවාරම පෙන්වා දිය හැකිය. එය විසින් උත්පාදනය කරනු ලබන අතිමහත් ධනය හේතුවෙන් මත්ද්‍රව්‍ය බෙදාහැරීම, අපරාධ සිදු කිරීම සහ අපරාධ කල්ලි අතර සමීප සබඳතාවක් හඳුනා ගනු ලැබ ඇත. දිගු කාලයක් පුරා පැවැති දූෂිත පාලනයන් තුළ මෙම ව්‍යසනය දේශපාලනය සමඟ සමීපව පවතිමින්, ඉන් වර්ධනය වී, රැකවරණ ලැබ දූෂිත වළල්ලේ ශක්තිමත් කොටසක් බවට පත්ව තිබූ බව මේ වන විට රහසක් නොවේ.

විශේෂයෙන් මෑතකාලීන පොලිස් විමර්ශනවලින් හෙළිදරව් වී ඇති කරුණු මඟින් රට තුළ සිදු වන බොහෝ අපරාධ විෂ මත්ද්‍රව්‍ය කේන්ද්‍ර කර ගනිමින් සිදු වන ඒවා බවට සනාථ වේ. මුල් කාලයේ විදේශීය සහ දේශීය පාතාල කල්ලිවල සබඳතා මඟින් ආනයනය කර සිදු කරන ලද මෙම ජාවාරම මේ වන විට දේශීය නිෂ්පාදන ජාලයක් දක්වා වර්ධනය වී තිබෙන බවට අනාවරණය වීම බිහිසුණු තත්ත්වයකි. මෙම තත්ත්වය කරා වර්ධනය වීමට විවිධ දේශපාලන බලපෑම්, ඇතැම් රාජ්‍ය නිලධාරීන්ගේ සහ ඇතැම් විට ආරක්ෂක අංශවල සාමාජිකයින්ගේ ද දායකත්වයන් ලැබී ඇති බවත්, විෂ මත්ද්‍රව්‍ය ජාවාරම සහ සංවිධානාත්මක අපරාධ අත්වැල් බැඳගනිමින් ශක්තිමත් යාන්ත්‍රණයක් ඔස්සේ ක්‍රියාත්මක වන බවත් පෙනී යයි.

## දැනට පවතින තත්ත්වය

ජාතික ජන බලවේග ආණ්ඩුව බලයට පත්වීමෙන් අනතුරුව අනුගමනය කරන ලද දැඩි ක්‍රියාමාර්ග හමුවේ ඉතිහාසයේ වැඩිම විෂ මත්ද්‍රව්‍ය ප්‍රමාණයන් අත්අඩංගුවට ගනිමින්, ප්‍රමුඛ පෙළේ ජාවාරම්කරුවන් සැලකිය යුතු සංඛ්‍යාවක් නීතියේ රැහැනට හසු කර ගැනීමට ශ්‍රී ලංකා පොලිසිය සහ ආරක්ෂක අංශ සමත්ව ඇත.

කෙසේ වුව ද, අපරාධ සංස්කෘතිය සමඟ ක්‍රියාත්මක මෙම විෂ මත්ද්‍රව්‍ය උවදුරේ ගැඹුර සහ ව්‍යාප්තිය සලකා බැලීමේ දී මත්ද්‍රව්‍ය වෙත ඇබ්බැහි වීම් වැළැක්වීම හා ජාවාරම මැඩලීම උදෙසා ආරක්ෂක අංශ අඛණ්ඩව මෙහෙයුම් සිදු කළ ද, එය පහසු කටයුත්තක් නොවේ. අනෙක් අතට ජාතික ව්‍යසනයක් ලෙසට වැඩී ඇති අර්බුදයක් හුදු ආණ්ඩුවක ක්‍රියාකාරීත්වයකින් පමණක් මැඩපැවැත්විය හැකි ද නොවේ. විශේෂයෙන් තරුණ පරම්පරාව විෂ මත්ද්‍රව්‍ය ජාවාරමුන් විසින් ඉලක්ක කර ගනු ලැබ ඇති අතර, අනාගත පරම්පරාව එයින් මුදා ගැනීමේ වගකීම ද සමාජයක් ලෙස භාරගත යුතුව තිබේ. විශේෂයෙන් මේ වසර තුළ පුනරුත්ථාපනය වූ 817කගෙන් 738ක් එනම්, සියයට 91.5ක් අවුරුදු 40ට අඩු වයස් කාණ්ඩයට අයත් ය. අනෙක් අතට විෂ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී ඇති සංඛ්‍යාව සමග සසඳද්දී පවතින පුනරුත්ථාපන ක්‍රියාවලිය පිළිබඳව කිසිසේත් සෑහීමකට පත්විය හැකි මට්ටමක නැත.

**2025.01.01 වන දින සිට 2025.10.22 වන දින දක්වා මත්ද්‍රව්‍ය වැටලීම් සම්බන්ධව**

| මත්ද්‍රව්‍ය | ප්‍රමාණය |  | වැටලීම් ගණන | සැකකරුවන් ගණන |
|---|---|---|---|---|
|  | kg | g |  |  |
| හෙරොයින් | 1482 | 820 | 59286 | 59243 |
| ගංජා | 14434 | 468 | 59660 | 59482 |
| කොකේන් | 32 | 642 | 91 | 86 |
| හෂීස් | 582 | 136 | 1525 | 1444 |
| අයිස් | 2542 | 454 | 67798 | 67762 |
| මත් පෙති / මත්කරල් | 3,961,790 |  | 2960 | 2921 |

**2025.01.12 වන දින සිට 2025.10.24 වන දින දක්වා විශේෂ මෙහෙයුම් වාර්තාව**

| | |
|---|---|
| පරීක්ෂා කල පුද්ගලයින් ගණන | 6127138 |
| අපරාධ සම්බන්ධයෙන් සෘජුව හඳුනාගත් පුද්ගලයින් ගණන | 5414 |
| සැකපිට අත්අඩංගුවට ගත් පුද්ගලයින් ගණන | 129448 |
| අත්අඩංගුවට ගෙන ඇති දින වරෙන්තුකරුවන් ගණන | 56365 |
| අත්අඩංගුවට ගෙන ඇති විවෘත වරෙන්තුකරුවන් ගණන | 37607 |

**2025.01.01 සිට 2025.10.23 දක්වා ගිනි අවි අත්අඩංගුවට ගැනීම්**

- ටී 56 ගිනි අවි - 67
- පිස්තෝල අවි - 73
- රිවෝල්වර් - 50
- වෙනත් අවි - 1907

මුළු එකතුව - 2097

දැනට මර්දනය හමුවේ යටපත් වී පැවැතිය ද, තව දුරටත් මහජන ආරක්ෂාව තර්ජනයට ලක් කරමින්, විෂ මත්ද්‍රව්‍ය උවදුර ආශ්‍රිතව සංවිධානාත්මක අපරාධ රැල්ලක් වර්ධනය වීමේ අනතුරක් ඇති බැවින්, හදිසි සහ කඩිනම් ජාතික වැඩපිළිවෙළක් තුළ ඉලක්කගත කාලසීමාවක දී විෂ මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහිව සමාජය බලගැන්වීම සිදු කළ යුතු ය. ඇබ්බැහි වූවන්ට ඉන් ගැලවීමට බල කෙරෙන හා උදවු කෙරෙන විධිමත් පුනරුත්ථාපන ක්‍රියාවලියක් ද ඒ හා සමගාමීව දියත් විය යුතු ය. ඒ වෙනුවෙන් මහජන සහභාගීත්වය සහිත පුළුල් වැඩපිළිවෙළක් සහ කඩිනම් එළැඹුමක් අවශ්‍යව තිබේ. විෂ මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය ජාතික උපද්‍රවයක් බවට පත්ව ඇති තත්ත්වයක් තුළ එය මුලිනුපුටා දැමීම ද ජාතික මට්ටමේ සංවිධානාත්මක වැඩසටහනක් ඔස්සේ සිදු කළ යුතු ය. එබැවින්, ජාතියේ හෙට දවස සුරක්ෂිත කිරීම සඳහා හදිසි සහ කඩිනම් ජාතික වැඩපිළිවෙළක් තුළින් නිශ්චිත ඉලක්කගත කාලසීමාවක දී විෂ මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහිව සමස්ත සමාජයම බලගැන්වීම සමස්ත පුරවැසියන්ගේ වගකීමක් සහ යුතුකමකි.

## ‘රටම එකට’

විෂ මත්ද්‍රව්‍ය මුලිනුපුටා දැමීමේ ‘රටම එකට ජාතික මෙහෙයුම’ නමින් වන යෝජනාවක් පසුගිය ඔක්තෝබර් 13 වැනි දින ජනාධිපතිවරයා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්නේ මෙම ජාතික අවශ්‍යතාව සම්පූර්ණ කිරීම වෙනුවෙනි.

මේ යටතේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික මෙහෙයුම් සභාවක් පිහිටුවීම යෝජනා කළ අතර මේ වන විට එය ස්ථාපනය කරනු ලැබ ඇත. මෙම ජාතික මෙහෙයුම් සභාවේ නායකත්වය සහ මඟපෙන්වීම යටතේ රජය සහ මහජනතාව ඒකාබද්ධව විෂ මත්ද්‍රව්‍ය උවදුර මුලිනුපුටා දැමීමේ ජාතික මෙහෙයුම සැලැසුම් කරනු ලබයි. එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පුළුල් මහජන සහාය ලබා ගැනීමේ යාන්ත්‍රණයක් යෝජනා කරන අතර, ඒ සඳහා දිස්ත්‍රික් මෙහෙයුම් සභා, ප්‍රාදේශීය මෙහෙයුම් සභා සහ ග්‍රාමීය මට්ටමෙන් මහජන ආරක්ෂක කමිටු ද සහිත ව්‍යුහයක් පිහිටුවීමට ද අපේක්ෂා කෙරේ.

### ජාතික මෙහෙයුම් සභාවේ කාර්යභාරය

i. නායකත්වය සහ මඟපෙන්වීම

■ ජාතික මට්ටමේ නායකත්වය සැපයීම:





රටම එකට ජාතික මෙහෙයුම් සභාවේ සංයුතිය

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති - සභාපති
02. ආගමික නායකයින් විසින් නම් කරනු ලැබූ නියෝජිතයින්
03. මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය
04. ජනාධිපති ලේකම් - ලේකම්
05. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්
06. මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ලේකම්
07. සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්
08. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්
09. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්
10. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම්
11. බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්
12. පොලිස්පති
13. ත්‍රිවිධ හමුදාපතිවරු
14. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
15. අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
16. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව
17. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
18. පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්
19. රජයේ ප්‍රධාන රස පරීක්ෂක
20. රාජ්‍ය මාධ්‍ය ආයතන ප්‍රධානීන්
21. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපති
22. සිවිල් සංවිධාන නියෝජනය කරමින් නියෝජිතවරු
23. විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් නියෝජිතවරු

සමස්ත විෂ මත්ද්‍රව්‍ය උවදුර මුලිනුපුටා දැමීමේ ක්‍රියාවලියට අවශ්‍ය ජාතික මට්ටමේ දේශපාලන නායකත්වය සහ කාර්යක්ෂමව තීන්දු තීරණ ගැනීමේ යාන්ත්‍රණය සඳහා මඟපෙන්වීම.

■ ඒකීය දිශානතිය තහවුරු කිරීම: වැඩසටහන නිවැරැදි සහ ඒකීය දිශානතියකට යොමු කිරීම.

ii. ජාතික මෙහෙයුම සැලැසුම් කිරීම සහ වැඩසටහන සැලැසුම් කිරීම

■ රජය සහ මහජනතාව ඒකාබද්ධ කර ගත් විෂ මත්ද්‍රව්‍ය උවදුර මුලිනුපුටා දැමීමේ ජාතික මෙහෙයුම සැලැසුම් කිරීම.

**එම මාසයන් තුල සමාජගත වූ පුනරුත්ථාපනලාභීන් සංඛ්‍යාව - 2023.01.01 - 2025.08.31 දිනට**

| වර්ෂය | මාසය |  |  |  |  |  |  |  |  |  |  |  | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
|  | ජන | පෙබ | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |  |
| 2023 | 47 | 57 | 63 | 107 | 102 | 59 | 93 | 57 | 110 | 64 | 101 | 109 | 969 |
| 2024 | 76 | 212 | 96 | 56 | 46 | 102 | 26 | 27 | 58 | 44 | 35 | 42 | 820 |
| 2025 | 35 | 26 | 22 | 50 | 69 | 48 | 46 | 108 |  |  |  |  | 404 |
| මුලු එකතුව |  |  |  |  |  |  |  |  |  |  |  |  | 2193 |

**මධ්‍යස්ථාන තුල සිටින පුනරුත්ථාපනලාභීන් සංඛ්‍යාව 2025**

| මධ්‍යස්ථානය | මාසය |  |  |  |  |  |  |
|---|---|---|---|---|---|---|---|
|  | ජනවාරි 31 | පෙබරවාරි 28 | මාර්තු 31 | අප්‍රේල් 30 | මැයි 31 | ජූනි 30 | ජූලි 31 |
| කන්දකාඩු | 98 | 131 | 199 | 215 | 209 | 217 | 280 |
| සේනපුර | 98 | 117 | 140 | 124 | 150 | 221 | 250 |
| වව්නියාව | 56 | 67 | 94 | 110 | 122 | 123 | 108 |

iii. ක්‍රියාත්මක කිරීමේ ව්‍යුහය ස්ථාපනය කිරීම

■ මහජන සහාය යාන්ත්‍රණය නිර්මාණය: පුළුල් මහජන සහාය ලබා ගැනීමේ යාන්ත්‍රණය ස්ථාපනය කිරීම

■ ප්‍රාදේශීය ව්‍යුහය පිහිටුවීම: දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමෙන් මහජන ආරක්ෂක කමිටුවල සහාය සහිතව වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ව්‍යුහයක් පිහිටුවීම.

iv. නෛතික සහ මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීම

■ නෛතික රාමුව ශක්තිමත් කිරීම: ක්‍රියාදාමය සඳහා අවශ්‍ය නව පනත් කෙටුම්පතක් ව්‍යවස්ථාදායකය වෙත ඉදිරිපත් කර සම්මත කර ගැනීමට කටයුතු කිරීම.

■ මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීම: සමස්ත විෂ මත්ද්‍රව්‍ය උවදුර මුලිනුපුටා දැමීම සඳහා වන ක්‍රියාදාමය මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීම.

දිස්ත්‍රික් මෙහෙයුම් සභාව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිගේ මූලිකත්වයෙන් ජාතික මෙහෙයුම් සභාවේ සංයුතියට අනුරූපීව ද, ප්‍රාදේශීය මෙහෙයුම් සභාව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිගේ මූලිකත්වයෙන් ජාතික මෙහෙයුම් සභාවේ සංයුතියට අනුරූපීව ද පිහිටුවනු ඇත. තවද, දැනටමත් 14,000ක් වන ග්‍රාමසේවා වසම් ආවරණය වන පරිදි මහජන ආරක්ෂක කමිටු පිහිටුවා ඇත. මෙයට අමතරව ‘රටම එකට ජාතික මෙහෙයුම’ මහජනතාව අතරට ගෙන යාම සඳහා සන්නාම තානාපතිවරුන්ගෙන් සහ ප්‍රකාශකයන්ගෙන් සමන්විත ව්‍යුහයක් ද සකස් කෙරෙනු ඇත.

**පුනරුත්ථාපනලාභීන් වයස් කාණ්ඩ අනුව 2025.01.01 සිට 2025.08.31 දක්වා**

| අ/අ | වයස් කාණ්ඩය | පුනරුත්ථාපනලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | 18 - 25 | 280 |
| 2 | 26 - 40 | 468 |
| 3 | 41 - 60 | 69 |
| මුලු එකතුව |  | 817 |

### “ඉවත් වෙනු!”

එහි මුඛ්‍ය ක්‍රියාකාරකමක්, “ඉවත් වෙනු!” තේමාව ඔස්සේ දැඩි ප්‍රචාරණ ක්‍රියාවලියක් මඟින් සමාජය විෂ මත්ද්‍රව්‍ය උවදුර සම්බන්ධයෙන් දැනුම්වත් කිරීමේ කඩිනම් වැඩසටහනක් ක්‍රියාත්මක කෙරේ. එයින් මත්ද්‍රව්‍ය විකුණන සහ ලොල්වුණු සැමට දැනුම් දීමක් ලෙස “ඉවත් වෙනු!” යන්න අවධාරණය කෙරේ. තමන්ට එරෙහිව මුළු මහත් සමාජයම නැඟීසිටින බවට බියක් (Fear Effect) සහ පීඩනයක් (Social Pressure) ජාවාරමට සහ භාවිතයට සම්බන්ධ සියලු පාර්ශ්වයන් තුළ ඇති කිරීමට මෙමඟින් අපේක්ෂා කෙරේ.




“අපේ සමාජයෙන්, අපේ ගමෙන්, අපේ රටෙන් ඉවත්වී යනු!” යන දැඩි, අභියෝගාත්මක සහ තර්ජනාත්මක පණිවිඩය විෂ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට සහ වෙළෙන්දන්ට මෙමඟින් ලබා දෙන අතර, ඇබ්බැහි වූවන්ට “වහා මෙම විනාශකාරී පුරුද්දෙන් ඉවත්වෙනු!” යන අවසාන අවවාදය සහ ඉන් මිදීමට ඇති අවස්ථාව පිළිබඳ පණිවුඩය මෙමඟින් නිකුත් කරනු ලබයි.

පුළුල් අර්ථයෙන් විෂ මත්ද්‍රව්‍ය ජාවාරම හා බැඳුණු ජාලය බිඳදැමීම සඳහා මහජන තෙරපුමක් ගොඩනැඟීම සහ ඇබ්බැහි වූවන්ට ඉන් ඉවත්වීමේ හා පුනරුත්ථාපනය වීමේ අවශ්‍යතාව අවධාරණය කරවීමට මෙම ‘ඉවත් වෙනු’ වැඩපිළිවෙළ මඟින් අපේක්ෂිත ය. විශේෂයෙන් මහජනතාව මඟින් මෙම ජාලයට අදාළ තොරතුරු ඒකරාශී කර ගැනීමටත්, ග්‍රාමීය මට්ටමේ මහජන ආරක්ෂක කමිටු බලගැන්වීම මඟින් ජාවාරමට අදාළ ජාලය බිඳදැමීමේ යාන්ත්‍රණය ශක්තිමත් කරගැනීමටත් බලාපොරොත්තු වේ.

රටම එකට ජාතික මෙහෙයුමේ පළමු අදියර තුළ ක්‍රියාකාරකම් මඟින් පවත්නා

# වානරයාගේ සිට මිනිසා දක්වා I කොටස

**තාක්ෂණික උපකරණවල දියුණුවත්, විද්‍යාවේ සංවර්ධනයත් සමඟ මානව පරිණාමය සම්බන්ධයෙන් සිදුකර තිබෙන නූතන සොයාගැනීම් සම්බන්ධ ලිපි මාලාවක් 'විමර්ශන' පසුගිය කලාප හරහා ඔබ අතට පත්විය. එම ලිපි පෙළ ආරම්භ වූයේ 'හෝමෝ' විශේෂයන් පරිණාමය වන්නට ඇතැයි විශ්වාස කරන ඔස්ත්‍රෙලෝපිතකස් විශේෂ සහ ඒ හා සමකාලීන පැරෑන්ත්‍රොපස්, ඊතියොපිතකස් ආදී විශේෂයන් පිළිබඳ වූ තොරතුරු සමඟිනි. එහෙත්, ලෝකයේ අප දන්නා වානරයන්ගෙන් වෙන්ව ඒ දක්වා පැමිණි ගමන්මඟ ද වැඩිදුර අධ්‍යයනය කිරීම වෙනුවෙන් මෙම ලිපි කිහිපය ලියැවේ.**


සාමාන්‍ය සමාජ කතාබහේදී බොහෝ විට කියැවෙන්නේ මානවයා වඳුරන්ගෙන් පැවැත එන බවයි. එහෙත්, වර්තමාන ලෝකයේ අප දකින වඳුරු විශේෂ කිසිදු ලෙසකින් හෝ අපගේ මුතුන්මිත්තන් නොවේ. එහෙත්, මානවයා ඇතුළු ලොව වෙසෙන අනෙකුත් වානරයන් සහ වර්තමාන ලෝකයේ අප දකින වඳුරන් පැවැත එන්නේ එකම පොදු මුතුන්මිත්තන්ගෙන් යැයි පවසන්නේ නම් එය සත්‍යයකි.


මිනිසා සහ වඳුරන් පමණක් නොව ගෝරිල්ලන්, ඔරංඔටං, චිම්පන්සින්, ගිබන් මෙන්ම උණහපුළුවන්ද අයත් වන්නේ එකම සත්ව ගෝත්‍රයකටයි. එම නිසා මෙම විශේෂ සියල්ල ප්‍රයිමේටා (Primates) ලෙස පොදු නමකින් හඳුන්වනු ලැබේ. මෙම ගෝත්‍රයේ සත්වයන් සතු විශේෂත්වයන් කිහිපයකි. සාමාන්‍යයෙන් වරකට එක් පැටවකු පමණක් බිහිකිරීම, ස්ථන ග්‍රන්ථි 2ක් පමණක් පිහිටීම, ශරීර ස්කන්ධයට සාපේක්ෂව මොළයේ ස්කන්ධය ඉහළ අගයක් ගැනීම, මුහුණ ඉදිරියෙන් ඇස් පිහිටීම නිසා ත්‍රිමාණ දර්ශන පථයක් පැවැතීම, අත් සහ පාද පහසුවෙන් චලනය කළ හැකි වීම, සංකීර්ණ ජීවන රටා සහ සන්නිවේදන ක්‍රම සහිතවීම ඉන් කිහිපයකි. සෙන්ටිමීටර් 10ක පමණ ශරීර විශාලත්වයකින් සහ ග්‍රෑම් 30ක පමණ ස්කන්ධයෙන් යුත් උණහපුළු විශේෂයන්ගේ සිට ශරීර බර කිලෝ ග්‍රෑම් 200 ඉක්මවූ විශාල ගෝරිල්ලන් දක්වා ප්‍රයිමේටා සත්ව විශේෂ අද ලෝකයේ දක්නට සිටී.

මෙම ප්‍රයිමේටා ලක්ෂණ සහිත සත්ව විශේෂ ප්‍රථම වරට මිහිමත බිහිවන්නේ අදින් වසර මිලියන 60-70ක පමණ කාලයකට පෙරදීය. එනම් ඩයිනසෝරස්ලා මිහිමතින් වඳවී යාමත් සමඟය. අදින් වසර මිලියන 66කට පමණ පෙර බිහිවන්නට ඇතැයි සැලැකෙන ප්‍රාථමික ප්‍රයිමේටා ලක්ෂණ සහිත ප්ලෙසියඩාපිෆෝම් (Plesiadapiforms) වර්ග ඊට උදාහරණ වේ.

ඒ අතුරින් ප්‍රයිමේටා ලක්ෂණ සම්පූර්ණ වූ සතුන් බිහිවන්නට ඇත්තේ ඇත්තේ, අදින් වසර මිලියන 55කට පමණ පෙර බවට විශ්වාස කෙරේ. එසේ මුල්ම වරට බිහිවූ විශේෂ අප දන්නා උණහපුලුවන් හා සමාන රුවකින් යුත් සාපේක්ෂව කුඩා සතුන් විය. ඔවුන් බිහි වූයේ නිවර්තන කලාපීය වනාන්තර තුළ බව පොදු පිළිගැනීම වේ. එහෙත්, ඒ අප්‍රිකානු කලාපයේ වනාන්තර වන්නට ඇතැයි බොහෝ විද්‍යාඥයන් සැක කළද, යුරෝපය ආශ්‍රිතව ප්‍රාථමික ප්‍රයිමේටා ලක්ෂණ සහිත සතුන් හමුවීමත්, ආසියානු වනාන්තර ආශ්‍රිතවද වසර මිලියන 45ක් පමණ පැරණි පොසිල හමුවීමත් නිසා ප්‍රයිමේටා විශේෂ බිහිවූයේ ලොව කුමන කලාපයකද යන්න මෙතෙක් අවසන් නිගමනයකට එළැඹ නැත. අදින් වසර මිලියන 47-56ත් අතර කාලයේදී ජීවත් වන්නට ඇතැයි සැලැකෙන ටේල්හාඩිනා (Teilhardina) මුලින්ම බිහිවූ ප්‍රයිමේටා ලක්ෂණ සම්පූර්ණවූ සත්වයකුට නිදසුනකි.

වඳුරන් බිහිවූයේ උණහපුළුවන් හා සමාන මෙම සතුන් පරිණාමය වීමෙනි. වත්මන් ලෝකයේ වෙසෙන වඳුරන්ද මූලික වශයෙන් වර්ග දෙකකි. ඉන් පළමුවැන්න 'නව ලෝක වඳුරන්' නම් වන අතර දෙවැන්න 'පැරණි ලෝක වඳුරන්' නම් වේ. ඒ අතුරින් ප්‍රථමයෙන්




බිහිවූයේ 'නව ලෝක වඳුරන්'ය. ඒ අදින් වසර මිලියන 40කට පමණ පෙර ඉයෝසීන අවධියේදීය. දැනට ලැබී ඇති සාක්ෂි පෙන්නුම් කරන්නේ මෙම නව ලෝක වඳුරන් ප්‍රථම වරට බිහිවන්නට ඇත්තේ, අප්‍රිකානු කලාපයේ බවටයි. එහෙත්, එය අවසන් නිගමනය නොවේ. සමහර විද්‍යාඥයන් තර්ක කරන්නේ 'නව ලෝක වඳුරන්'ගේ පූර්වජයින් දකුණු ඇමෙරිකානු කලාපයට සංක්‍රමණය වීමෙන් පසු එහිදී ඔවුන් පරිණාමය වන්නට ඇති බවටයි. පේරුවලින් හමුව ඇති වසර මිලියන 36ක් පැරණි පේරුපිතකස් (Perupithecus) පෙන්නුම් කරන්නේ ඒ වන විටත් නව ලෝක වඳුරන් දකුණු ඇමෙරිකා මහාද්වීපයේද වාසය කළ බවයි.

මෙම නව ලෝක වඳුරන් අද වාසය කරන්නේ මධ්‍යම සහ දකුණු ඇමෙරිකා ප්‍රදේශ ආශ්‍රිතව පමණි. ඔවුන් සාපේක්ෂව කුඩා වඳුරන් විශේෂ වන අතර එයින් කුඩාම විශේෂ දිගින් සෙන්ටි මීටර් 14ක් පමණ හා බරින් ග්‍රෑම් 150ක් පමණ තරම් කුඩා වේ. ඉන් විශාලතම විශේෂයන්ගේ උපරිම දිග (වලිගය නොසලකා හැර) සෙන්ටිමීටර් 70ක් පමණ වන අතර, බර කිලෝ ග්‍රෑම් 12-15ක් පමණ වේ.


'නව ලෝක වඳුරන්'ගෙන් වෙන්ව 'පැරණි ලෝක වඳුරන්' ලොව බිහිවන්නේ අදින් වසර මිලියන 25-30 පමණ කාලයකට පෙර ඔලිගොසීන අවධියේදීය. එය සිදුවූයේ අප්‍රිකානු කලාපය ආශ්‍රිතව බව බොහෝ විද්‍යාඥයින්ගේ




කොරෝරපිතකස් හිස්කබලක්

මතයයි. ශ්‍රී ලංකාව ආශ්‍රිතව ජීවත්වන රිලවුන්, කලු වඳුරන්, අලු වඳුරන් යන විශේෂ 3ම අයත් වන්නේ ද 'පැරණි ලෝක වඳුරන්'ගේ කාණ්ඩයටය. වර්තමානයේ මෙම කාණ්ඩයට අයත් වඳුරන් ජීවත් වන්නේ අප්‍රිකාව සහ දකුණු, අග්නිදිග, නැගෙනහිර ආසියානු කලාප ආශ්‍රිතව පමණි. ඉන් කුඩාම වඳුරන් දිගින් සෙන්ටිමීටර් 37ක් පමණ ද බරින් කිලෝ ග්‍රෑම් 1ක් පමණ ද වන අතර විශාලතම වඳුරන් දිගින් සෙන්ටිමීටර් 70ක් පමණ ද කිලෝ ග්‍රෑම් 50ට වැඩි බරකින් ද යුක්ත වේ.

'නව ලෝක වඳුරන්' සාපේක්ෂව කුඩා වන අතර, මුහුණෙන් පිටතට නිර්මාණය වුණු



ඊජිප්තොපිතකස්



ටේල්හාඩිනා

පුළුල්, පැතලි නාසයකින් යුක්තය. උහු වැඩි වශයෙන් ගස් මත වාසය කරන අතර, යම් යම් දේ අල්ලා ගැනීම සඳහා බොහෝ විට වලිගය භාවිත කරති. සාමාන්‍යයෙන් මෙම කාණ්ඩයේ වඳුරන්ට දත් 36ක් හිමි අතර, වර්ණ වෙන් කර හඳුනා ගැනීමේ හැකියාව අවමය.

සාපේක්ෂව ප්‍රමාණයෙන් විශාල 'පැරණි ලෝක වඳුරන්' සතුව මුහුණේ පහළ දෙසට විහිදුණු පටු නාසයක් ඇත. ගස් මත මෙන්ම බිමද ඇවිද යාමට මැලිකමක් නොදක්වන මොවුහු කිසිදු ආකාරයකින් වලිගය ප්‍රයෝජනයට නොගනිති. දත් 32ක් හිමි මෙම කාණ්ඩයට අයත් වඳුරන්ගේ වර්ණ හඳුනා ගැනීමේ හැකියාව ඉහළය. පසුකාලීනව අප්‍රිකානු කලාපය ආශ්‍රිතව වානරයන් පරිණාමය වන්නේ 'පැරණි ලෝක වඳුරන්' වැනි පූර්වජයින්ගෙනි.

වඳුරන්ට සාපේක්ෂව වානරයන් සතු ප්‍රධානම වෙනස වන්නේ වානරයන්ට වලිග



ශිවපිතකස් හිස්කබලක කොටසක්

යක් නොතිබීමයි. එමෙන්ම වඳුරන් ඇවිදීමේදී බොහෝ සෙයින් පාද 4ම භාවිත කරන අතර පාද 2න් සිට ගැනීම සහ ඇවිදීම වානරයෝ බහුලව සිදු කරති. එමෙන්ම වඳුරන්ට සාපේක්ෂව වානරයන් සතුව ශක්තිමත් මෙන්ම අත් හොඳින් කරකැවිය හැකි උරහිස් පවතින අතර, පුළුල් සහ වැඩුණු උරස් ප්‍රදේශයක් පවතී. වානරයන් සාපේක්ෂව බුද්ධිමත්භාවයෙන්ද ඉහළය.

වානරයන් ප්‍රථම වරට මිහිමත බිහිවන්නට ඇත්තේ, අදින් වසර මිලියන 25කට පමණ පෙර බවට විශ්වාස කෙරේ. අදින් වසර මිලියන 35-29ත් අතර වාසය කරන්නට ඇතැයි විශ්වාස කෙරෙන ඊජිප්තුවෙන් හමුව ඇති ඊජිප්තොපිතකස් (Aegyptopithecus) යනු එවකට සිටි පැරණි ලෝක වඳුරන් සහ වානරයන් අතර පරිණාමයේ අතරමැදියකු ලෙස සැලැකේ. එමෙන්ම කෙන්යාවෙන් හමුව ඇති ප්‍රොකොන්සල් අප්‍රිකානුස් (Proconsul Africanus) වසර මිලියන 20-23ත් අතර ඈත අතීතයේ ජීවත් වූ මුල්ම වානර විශේෂයකි.

එලෙස බිහිවූ වානරයන් 'මහා වානරයන්' සහ 'කුඩා වානරයන්' ලෙස වර්ග දෙකකට වෙන් කෙරේ. මෙයින් ගිබන් වැනි විශේෂ අයත් 'කුඩා වානරයන්' සාමාන්‍යයෙන් කිලෝ ග්‍රෑම් 5-12ක පමණ බරකින් යුක්ත වේ. උහු ගස් මත එල්ලී සිටීමට සහ පැද්දෙමින් ගමන් කිරීමට අත් භාවිත කරති. අධික ශබ්ද පිට කරන අතර, ශබ්ද පාලනය කිරීමේ හැකියාව සාපේක්ෂව වැඩිය. උහු සමස්ත කාලයම ගස් මත වාසය කරති. ගෝරිල්ලන් වැනි විශේෂ අයත් 'මහා වානරයන්' කිලෝ ග්‍රෑම් 50 සිට 200 ඉක්මවූ අගයන් දක්වා බරින් යුක්තය. පුළුල් පපුවක් සහ ශක්තිමත් බාහු සහිත අත්වලින් යුක්තය. සාපේක්ෂව බුද්ධිමත්භාවය වැඩි අතර, වැඩි වේලාවක් භූමිය මත රැඳී සිටීමට උහු ප්‍රිය කරති.

මේ අතරින් කුඩා වානරයන්ගේ ගමන් මඟින් වෙන්ව වෙනම විශේෂයක් ලෙස 'කුඩා වානරයන්' පරිණාමය වීම ඇරඹෙන්නට ඇත්තේ, අදින් වසර මිලියන 18කට පමණ පෙර බවට විශ්වාස කෙරේ. ඔවුන් අද වාසය කරන්නේ ඊසානදිග ඉන්දියාවේ, බංගලාදේශයේ සහ අග්නිදිග ආසියානු

GLOBAL NEWS ජාත්‍යන්තර තොරතුරු

# බ්‍රසීලයේ හිටපු ජනපති බොල්සනාරෝ වසර 27කට සිපිරිගෙට



**බ්‍රසීලයේ හිටපු ජනපති, අන්ත දක්ෂිණාංශික ජයිර් බොල්සනාරෝ වසර 27කුත් මාස තුනක් දක්වා වන සිරදඬුවමකට ලක් කිරීමට බ්‍රසීල අධිකරණය නියම කර ඇත. ඊට අමතරව රාජ්‍ය දේපළවලට සිදුව ඇති හානිපූරණය කර ගන්නා ලෙසත් නියම කර ඇත. ජයිර් බොල්සනාරෝ හට මෙම දඬුවම් ලබා දීමට පදනම්වූ හේතුව වන්නේ රාජ්‍යයට එරෙහි කුමන්ත්‍රණයයි. ඔහුට අධිකරණය විසින් කරුණු පහකට අදාළව චෝදනා ගොනු කර තහවුරු කරන ලදී. ඒ සන්නද්ධ අපරාධමය කුමන්ත්‍රණය, ප්‍රජාතන්ත්‍රවාදී පාලනය බිඳහෙළීමට තැත් කිරීම, රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණය, මහජන දේපළ විනාශ කිරීම සහ ජාතික උරුමවලට හානි සිදු කිරීම ආදිය සම්බන්ධයෙනි.**

2022 පැවැති ජනාධිපතිවරණයේදී එවකට ජනපති, ජයිර් බොල්සනාරෝ සහ ලූලා ද සිල්වා අතර පැවැති තියුණු තරගයේදී ලූලා ද සිල්වා වැඩි ඡන්ද සුළු ප්‍රමාණයකින් ජයග්‍රහණය කළේය. කෙසේ නමුත්, මෙම ජයග්‍රහණය බොල්සනාරෝගේ ආධාරකරුවන් නොපිළිගත් අතර, රට පුරා නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල ප්‍රචණ්ඩ විරෝධතා ආරම්භ කරන ලදී.

ලූලා ද සිල්වා 2023 ජනවාරි පළමු වනදා බ්‍රසීලයේ 39 වන ජනාධිපතිවරයා ලෙස දිවුරුම් දුන්නේය. ඉන් සතියකට පසුව ජනවාරි 8 වැනි දින බොල්සනාරෝගේ ආධාරකරුවන් විසින් අධිකරණය, ජාතික කොන්ග්‍රසය සහ ජනාධිපති කාර්යාලය ආක්‍රමණය කරන ලදී. පසුව ලූලා ද සිල්වාගේ පාලනය විසින් කුමන්ත්‍රණය පාලනය කරන ලද අතර කුමන්ත්‍රණයට නායකත්වය දුන් සැලැකිය යුතු පිරිසක් අත්අඩංගුවට ගන්නා ලදී. මෙම කුමන්ත්‍රණයට නායකත්වය හෝ සහයෝගය දුන් හිටපු ඔත්තු සේවා ප්‍රධානියා, හිටපු නාවික හමුදා ප්‍රධානියා, හිටපු ආරක්ෂක අමාත්‍යවරයා ඇතුළු බොල්සොනාරෝ රජයෙහි හිටපු ප්‍රබලයන් කිහිප දෙනකුම බොල්සනාරෝ හට ලබා දුන් දඬුවටම යටත් කරන ලදී.

හිටපු ජනාධිපති, බොල්සනාරෝගේ පාලනය වඩාත් ප්‍රචලිත වන්නේ අතිදක්ෂිණාංශික සහ දැඩි ඇමෙරිකානු හිතවාදී පාලනයක් ලෙසයි. ඔහුගේ පාලන කාලය තුළින් ඇමේසන් වනාන්තරය සහ එහි ජීවත්වන ස්වදේශිකයන් සම්බන්ධයෙන් පවත්වාගෙන ගිය ප්‍රතිපත්ති ජාත්‍යන්තරය තුළ දැඩි ආන්දෝලනයකට ලක් විය. ජූලි මාසය තුළ බොල්සනාරෝට එරෙහිව ගෙන ගිය පරීක්ෂණය සම්බන්ධයෙන් චෝදනා කරමින්, ඇමෙරිකානු ට්‍රම්ප් පාලනය විසින් සියයට 50කින් වෙළෙඳ බදු ඉහළ දමන බවට තර්ජනය කරන ලදී. බොල්සනාරෝ පසුගිය අගෝස්තු මාසයේදී නිවාස අඩස්සියට පත් කළ පසු මෙම වෙළෙඳ බදු යෙදීම ඇමෙරිකාව විසින් ආරම්භ කරන ලදී. ඒත් සමඟ බොල්සනාරෝගේ ආධාරකරුවන් අතුරින් මතභේදද වර්ධනය විය.

2022දී පැවැත්වූ ජනාධිපතිවරණයේදී වාමාංශික නායකයකු ලෙස ප්‍රචලිතව සිටි ලූලා ද සිල්වා දෙවන වරට එරට ජනාධිපති ධුරයට පත්වූ අතර ලතින් ඇමෙරිකාව පුරා වාමාංශිකයන්ගේ පූර්ණ සහයෝගය ඔහු අත්පත් කරගෙන ඇත.

# ඉන්දියානු ජනතාවට නව බලාපොරොත්තුවක්...!

## කේරළය අන්ත දරිද්‍රතාව අවසන් කරන පළමු ඉන්දියානු ප්‍රාන්තය බවට පත් වන ලකුණු



2025 නොවැම්බර් මස වන විට කේරළය ඉන්දියාවේ අන්ත දරිද්‍රතාව තුරන් කරන ලද පළමු ප්‍රාන්තය විය හැකි බවට කේරළ මහ ඇමැති, පිනරායි විජයන් පවසා ඇත. ඔහු ඒ බව පවසා ඇත්තේ, කේරළ ප්‍රාන්තයේ මැතිවරණ ආසන 140න් එකක් වන ධර්මඩම් හි අන්ත දරිද්‍රතාව තුරන් කිරීම සාර්ථකවූ අවස්ථාව සැමරීමට සහභාගිවූ අවස්ථාවේදීය. ධර්මඩම් යනු කේරළයේ අන්ත දරිද්‍රතාව තුරන් කළ පළමු ප්‍රදේශයයි.

2021දී අන්ත දරිද්‍රතාව මුලිනුපුටා දැමීමේ ව්‍යාපෘතිය (EPEP) ආරම්භ කරමින් ඉතා සැලැසුම්සහගත ලෙස කේරළ ප්‍රාන්ත රජය මෙම ක්‍රියාවලියට මැදිහත් විය. මූලික පියවර හතරක් හරහා අන්ත දරිද්‍රතාව සහිත පවුල් හඳුනා ගන්නා ලදී. අන්ත දරිද්‍රතාව මැනීම සඳහා ආහාර, ආදායම, වාසස්ථාන සහ සෞඛ්‍යය යන මූලික අවශ්‍යතා සැලැකිල්ලට ගන්නා ලදී.

1970දී සියයට 59.79 ක්ව පැවැති කේරළ ප්‍රාන්ත දරිද්‍රතාව 2011 වන විට සියයට 11.03 දක්වා පහත හෙළීමට කේරළ රජයට හැකි විය. ඒ සඳහා කේරළය තුළ වූ කෘෂි-ඉඩම් ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය දැඩි බලපෑමක් එල්ල කළේය. ඉඩම් හිමියන්ට අයත්ව තිබූ බොහෝ ඉඩම්, ඉඩම් අහිමි ගොවීන් හට ලබා දෙන ලදී. 2017දී ආරම්භ කරන ලද 'ආරදුම්' මෙහෙයුම නම් සෞඛ්‍යය සම්බන්ධ වැඩසටහන හරහා ප්‍රාථමික සෞඛ්‍ය සේවාවන් විමධ්‍යගත කරන ලදී. 1998දී ආරම්භ කරන ලද 'කුටුම්භශ්‍රී' කාන්තා බලගැන්වීම් වැඩසටහන හරහා කාන්තාවන් දුප්පත්කමෙන් මුදාගැනීම ආරම්භ කරන ලදී. අගති රහිත 'කේරළම්' වැඩසටහන හරහා වැඩිහිටියන්ට, ආබාධිත අයට සහ ළමයින්ට සමාජ සුභසාධන ආරක්ෂක දැලක් ආරම්භ කරන ලදී. මෙම ක්‍රියාවලි හරහා අද වන විට ඉන්දියාවේ සියයට 96.2ක් ලෙස ඉහළම සාක්ෂරතාව හිමි ප්‍රාන්තය ලෙස කේරළ ප්‍රාන්තය පත්ව ඇත.

අන්ත දරිද්‍රතාව මුලිනුපුටා දැමීම සඳහා චීනයෙන් ආදර්ශ ලබා ගන්නා කේරළ ප්‍රාන්තයෙහි සංඛ්‍යා දත්ත විශ්ලේෂණයට අනුව 2025 නොවැම්බර් මස වන විට කේරළය තුළ අන්ත දරිද්‍රතාව සම්පූර්ණයෙන් මුලිනුපුටා දැමීමට හැකි වන බවට අනාවැකි පළ වෙමින් තිබේ.

## අර්බුදයට විසඳුම ලෙස ....

01 - පිටුවෙන්

අනෙක් අතට විදේශ ආයෝජන වැඩිවීම නිසා යහපත් විනිමය සංචිතයක් පවත්වාගෙන යාමටද හැකිවිය. ඒ අනුව 2021 වසරේ ඩොලර් මිලියන 1898 ක් වූ විදේශ සංචිත 2024 වසර නිමවනවිට 6,122 ක් ලෙසත් 2025 සැප්තැම්බර් මාසය වනවිට එයඩොලර් මිලියන 6,178 දක්වා ඉහල නංවා ගැනීමත් ආණ්ඩුව ආර්ථික ඉලක්ක සපුරා ගැනීම තහවුරු කරන ප්‍රභල කරුණු බවට පත්වේ. මේ අනුව බලනකල ආණ්ඩුව ක්‍රමානුකූලව ආර්ථික වර්ධනයක් අත්පත් කරගනිමින් සිටින අතර එය ඉදිරි වසර වලදී තවත් ඉදිරියට යන බව මෙයින් තහවුරු වේ.

## විෂ මත් ද්‍රව්‍ය ....

02- 03 - පිටුවෙන්

නෛතික රාමුව තුළ උවදුර මුලිනුපුටා දැමීම සඳහා වන ක්‍රියාදාමය ශක්තිමත් කර නිවැරැදි සහ ඒකීය දිශානතියකට යොමු කිරීම ඉලක්ක කෙරේ. එම අදියර තුළ පවතින නෛතික රාමුව වඩාත් ශක්තිමත් කිරීමට සහ ඉදිරියේදී නව පනත් කෙටුම්පතක් ව්‍යවස්ථාදායකය වෙත ඉදිරිපත් කර සම්මත කර ගැනීමටත්, ඊළඟ අදියරෙහි ක්‍රියාත්මක කිරීමට නියමිත තිරසර වැඩසටහන සඳහා එම නව නෛතික රාමුව තුළ කටයුතු කිරීමටත් අපේක්ෂිතය.

මත්ද්‍රව්‍ය ව්‍යසනය යනු තවදුරටත් සුළුකොට තැකිය හැකි ප්‍රශ්නයක් නොවේ. එය රටේ දරුවන්ගේ අනාගතයත්, රටේ ස්වෛරීත්වයත් බිලිගන්නා ජාතික ව්‍යසනයකි. මෙම ව්‍යසනය පරාජය කළ හැක්කේ මත්ද්‍රව්‍ය ජාවාරමේ නියුතු සුළුතර සංවිධානාත්මක ජාලයේ ශක්තියට වඩා රටට ආදරය කරන අතිබහුතර පුරවැසියන්ගේ සංවිධානාත්මක ජාලය ශක්තිමත් කිරීමෙන් පමණි. "ඉවත්වෙනු!" යනු එම ජනතා බලය අවදි කිරීමේ පළමු වෙඩිමුරයයි.

## වානරයාගේ සිට මිනිසා දක්වා ....

04-05 - පිටුවෙන්

කලාපය ආශ්‍රිත රටවල පමණි. කෙන්යාවෙන් හමුවූ වසර මිලියන 17ක් පැරැණි කෙන්යාපිතකස් (Kenyapithecus) යනු 'කුඩා වානරයන්' අප්‍රිකාවෙන් පිටමං වීමට පෙර සිටි පූර්වජයකු ලෙස සැලැකේ. කෙසේ නමුත්, ඔවුන් පරිණාමය වීම ආරම්භ වූයේ අප්‍රිකාවේද නැතහොත්, ආසියාවේද යන්න තවමත් නිශ්චිත නැත. ඉන්දියාවෙන් හමුව ඇති වසර මිලියන 13ක් පැරැණි කාපි රම්නාගැරෙන්සිස් (Kapi Ramnagarensis) වත්මන් ගිබන්ගේ පූර්වජයකු වන්නට ඇතැයි විශ්වාස කෙරේ. චීනයෙන් හමුවූ වසර මිලියන 7ක් පැරැණි බූනොපිතකස් (Bunopithecus) වත්මන් ගිබන්ට බොහෝ සෙයින් සමාන වේ.

පරිණාමයේදී මීළඟට වෙන්ව ගොස් ඇත්තේ ඔරංඔටන් වේ. අප්‍රිකාවෙන් පිටත දක්නට හැකි එකම 'මහා වානර' විශේෂය වන මොවුන් ජීවත් වන්නේ අග්නිදිග ආසියා ප්‍රදේශවල පමණි. වසර මිලියන 14-12ත් අතර කාලයේදී වෙන්ව පරිණාමය වීම ඇරඹූ ඔරංඔටන් තමන්ගේ ජීවිත කාලයෙන් සියයට 90ක් පමණම ගස් මත වාසය කරයි. අදින් වසර මිලියන 8-12ත් අතර කාලයකට පෙර ජීවත්වූ, ඉන්දියාවෙන්, පකිස්ථානයෙන් සහ නේපාලයෙන් පොසිල කොටස් හමුවී ඇති සිවපිතකස් (Sivapithecus) යනු මානව පරිණාමයේ පුරුකක් බව මුලදී විශ්වාස කළද, (රාමපිතකස් ලෙස හැඳින්වූයේද මෙම විශේෂයමය) අද වන විට තහවුරු වී ඇත්තේ ඒ ඔරංඔටන්ගේ මුතුන්මිත්තකු බවයි. තායිලන්තයෙන් හමුවූ වසර මිලියන 7-9ක් පමණ පැරැණි බොරාට්පිතකස් (Khoratphithecus) යනු සිවපිතකස්ගේ සිට වත්මන් ඔරංඔටන් දක්වා පරිණාමයේ අතරමැදි පුරුකක් ලෙස සැලැකේ. මිනිසාගේ ජාන සියයට 97 පමණ ඔරංඔටන්ට සමාන වේ.

'මහා වානරයන්'ගෙන් මීළඟට වෙන්වූයේ ගෝරිල්ලන් වන අතර, ඔවුන් වර්තමානයේ ජීවත් වන්නේ බටහිර සහ නැගෙනහිර අප්‍රිකානු ප්‍රදේශවල පමණි. මයෝසීන අවධියේ අවසානයත් සමඟ එනම්, අදින් වසර මිලියන 8-10ත් අතර කාලයකට පෙර ගෝරිල්ලන් මානව පරිණාමයේ පෙළින් වෙන්ව පරිණාමය වන්නට ඇතැයි සැලැකේ. ඉතියෝපියාවෙන් හමුවූ වසර මිලියන 8ක් පමණ පැරැණි කොරෝරපිතකස් (Chororapithecus) එම අවධියේ සිටි වත්මන් ගෝරිල්ලාගේ මුතුන්මිත්තකු සේ සැලැකේ. භූමියේ වාසය කිරීමට බොහෝ සෙයින් ප්‍රිය කරන, ඇවිදීම සඳහා තම අත්ද භාවිත කරන ගෝරිල්ලාගේ ළඟම නෑයන් වන්නේ චිම්පන්සියා සහ මිනිසායි. මිනිසාගේ ජාන සියයට 98ක් පමණ ගෝරිල්ලාට සමාන වේ.

අවසන් වශයෙන් මිනිසාගේ පරිණාම ගමනෙන් වෙන්ව පරිණාමය වූ, වර්තමානයේ මිහිමත සිටින සත්වයා වන්නේ චිම්පන්සියායි. එනම්, වර්තමානයේ මිහිමත ජීවත්වන සතුන් අතුරින් අපගේ ළඟම නෑයා වන්නේ ද චිම්පන්සියායි. අදින් වසර මිලියන 7කට පමණ පෙර මිනිසාට සහ චිම්පන්සියාට පොදු පූර්වජයකු වූ අතර, එයින් පසු ඔවුන් වෙනස් මාර්ග දෙකක් ඔස්සේ පරිණාමය වීමෙන් මෙම විශේෂයන් දෙවර්ගය බිහිව ඇත. එම වෙන්වීමෙන් පසු අදින් වසර මිලියන 2කට පමණ පෙර චිම්පන්සින්ගෙන් වෙන්ව බොනොබෝ සතුන් බිහිව ඇත. මධ්‍යම සහ බටහිර අප්‍රිකානු ප්‍රදේශවල වාසය කරන චිම්පන්සින් සහ බොනොබෝවන් මිනිස් ජානවලට සියයට 98.6කට ආසන්න සමානකමක් දක්වයි. එමෙන්ම මේ දෙවර්ගයම ඝන සෙන්ටිමීටර් 400ක පමණ කපාල ධාරිතාවකින් යුක්තය.

මේ නිසා මානව පරිණාමය වානරයාගෙන් වෙන්වූ මොහොත වශයෙන් (මෙය සාමාන්‍ය භාවිතය අනුව පැවසුවද, මානවයාද විද්‍යාත්මකව සැලැකූ කල 'මහා වානර' ගණයට අයත් වේ) සැලැකිය හැක්කේ චිම්පන්සියාගෙන් වෙන්වූ මොහොත වේ.

(මීළඟ කලාපය හා සම්බන්ධයි.)

## ඉන්ද්‍රජාලික මායා යථාර්ථවාදය.......

08 - පිටුවෙන්

ජපානයේ හරුකි මුරකමි ආදීහුද මේ අතරට එක් වෙති. මායා යථාර්ථවාදයේ ඉදිරි පෙළ කෘති අතර ගාර්ෂියා මාර්කේස්ගේ 'සියක් වසක හුදෙකලාව', ඉසබෙල් අයියන්දේගේ 'මායාවාස' සල්මන් රුෂ්ඩිගේ 'මැදියම් රැයේ දරුවන්' ආදිය දැක්විය හැකිය. ශ්‍රී ලංකාව තුළ මායා යථාර්ථවාදය ඇසුරු කළ ලේඛකයා සයිමන් නවගත්තේගමය. ඔහුගේ කෘති අතර 'සංසාරණ්‍යයේ දඩයක්කාරයා' සහ 'ක්ෂීර සාගරය කැළඹිණ' මෙම රීතියේ කෘති වේ.

ඉන්ද්‍රජාලික මායා යථාර්ථවාදයේ මූලික ලක්ෂණ මෙසේය:

1. යුරෝපය කේන්ද්‍රීයවූ සම්මත යථාර්ථවාදය ප්‍රතික්ෂේප කිරීම.

2. නව යටත්විජිතවාදී රටවල පාරම්පරික ජනශ්‍රැති භාවිත වේ.

3. කාලය, දේශය සහ අනන්‍යතාව පිළිබඳ සාම්ප්‍රදායික සංකල්ප බිඳහෙළයි.

4. සුරංගනා කතාවන් තුළ සමස්තය වශයෙන් පවතින මායාවන් මෙන් නොව කතාවේ පවතින යථාර්ථයට විශේෂ කොට ගත් මායාවන් එක් කරයි.

5. භාෂා උපක්‍රම අතිශය අපූර්වත්වයක් සහිතයි.

6. ගතානුගතිකත්වය බිඳහෙළයි.

7. නූතනත්වය විෂයමූලිකව ගළපාලයි.

දීර්ඝ කාලයක් තිස්සේ සෙමෙන් වර්ධනය වෙමින් පැමිණ 1940න් පසු සාහිත්‍ය ප්‍රවණතාවක් ලෙස විශේෂීකරණයවූ මායා යථාර්ථවාදය 1960න් පසු පාථිවි ගෝලය සිසාරා අධිරාජ්‍ය විරෝධයත්, වාමාංශික බවත් කැටි කොටගෙන වත්මන් ලෝකයේ නවකතාව, කෙටිකතාව ආදියේ ප්‍රබල ස්ථානයක් හා වපසරියක් ග්‍රහණයට ගෙන තිබේ. මේ වන විට අප අධ්‍යාපන කවය තුළ සාකච්ඡා කෙරෙමින් පවතින 'කැමෙලියා' නවකතාවේ මෙම මායා යථාර්ථවාදය ඉතා පුළුල්ව යොදා ගනු ලැබ තිබේ.

# ඉන්ද්‍රජාලික මායා යථාර්ථවාදය
# Magical Realism

විචාර කලාවේද, නිර්මාණ කලාවේද විවිධ ප්‍රවණතා මෙන්ම කලා රීතිද පවතී. විශේෂයෙන්ම සාහිත්‍ය කලාවන්හි එවන් ප්‍රවණතාවන් හා ඒකගතාවන් කාලානුරූපව දක්නට ලැබේ. ඉන්ද්‍රජාලික මායා යථාර්ථවාදය යනු එවන් ප්‍රවණතාවකි. එය විශේෂ කොට වටහා ගැනීමට අප සාහිත්‍යය නම් කලා ධාරාවේ නවකතාව නම් සාහිත්‍ය මාධ්‍යය හඳුනාගත යුතුය.


කතාන්දර කීම මානව ඉතිහාසයේ භාෂණය ඇරඹි අවධියට අනුරූප වේ. දවසේ ආහාර සෙවීමේ විශේෂයෙන් දඩයම් කිරීමේ අත්විඳීම් ගෝත්‍රයේ අනෙක් පිරිස හා වචනයද, අභිනයද භාවිත කරමින් සන්නිවේදනය කිරීම් හරහා නාට්‍ය කලාවද, කතාන්දර කලාවද බිහිවිය. අත්විඳීම්, පරිකල්පනය හා එක්වීමෙන් කතාන්දර කලාව බිහිවේ. ලිවීමේ තාක්ෂණය හා කලාව සමඟ කතාන්දර ලිවීම ආරම්භ වේ. පංති සමාජයේ ලිවීමේ, කියැවීමේ හැකියාව පැවැතියේ වරප්‍රසාදයක් ලෙසය. එය පාලක පංතියේ සහ ආගමික සංස්ථාවන්හි වරප්‍රසාදයක් විය. ලංකා ඉතිහාසය ගත්තද, 'ජාතක කතා', 'බණ පොත්' අකුරු නොදත් අය උගත්තේ අකුරු දත් අය විසින් කියවන දෙය අසා සිටීමෙනි.

කතාන්දර කලාව දේව කතා සාහිත්‍යය තුළින් වීර කාව්‍ය යුගයට පිවිසිණි. වීර කාව්‍යයන්හි පිළිබිඹු වූයේ ශක්තිමත්, පිරුණු පේශි පිරි බාහු සහිත, ප්‍රතාපවත්, දේවත්වය හා බැඳුණු සටන්කාමීන්ය. ඔවුනගේ කගපත හෝ වෙනත් අවියක් සතුරන් දෙපළු කළේය. හෝමර්ගේ 'ඉලියඩ්' සහ 'ඔඩිසි' මෙන්ම වාල්මිකීගේ 'රාමායණයත්', ඉන්දියාවේම උපන් 'මහා භාරතයත්' මෙවන් වීර කාව්‍යය වේ. වීර කාව්‍යයන්හි වීරයෝ තම බාහු බලයෙන් හා අත දැරූ අවි බලයෙන් සතුරා ජය ගත්තෝය.

ධනවාදී සමාජය බිහිවීමත් සමඟ කතාන්දර කලාවේ දිශානතිය වෙනස් විය. වීරත්වය යන්න මුදලට යට වන්නට විය. ප්‍රාග්ධන බලය හිමි තැනැත්තෝ තම අත දැරූ අවි බලයෙන් හෝ තම කුලී ඝාතකයාගේ අවි බලයෙන් සතුරා මැඬලති. ධනවාදය තුළ සූරාකෑමේ ක්‍රියාවලිය සංකීර්ණ විය. ධනවාදය තුළ පංති ගැටුම සංකීර්ණ විය. ධනවාදය තුළ සමාජ සම්බන්ධතා සංකීර්ණ විය. මෙනිසාම ධනවාදය තුළ කතාන්දර කලාවද සංකීර්ණ විය. මෙම සංකීර්ණ තත්ත්වය ග්‍රහණය කර ගන්නට හැකි කතාන්දර මාධ්‍යය වූයේ නවකතාවයි.

ධනේශ්වර සමාජය තුළ 17 වැනි සියවස දක්වා මතුවූ සාහිත්‍ය විචාර රීතිය 'සමාජ අසාධාරණය විවේචනය කිරීමයි'. එය සමස්ත සමාජ සම්බන්ධතා ක්‍රමයද, එහි ක්‍රියාවද, ප්‍රතිරෝධතාද විවේචනය කරයි. මෙම නිර්මාණ හා විචාර රීතිය 'විවේචනාත්මක යථාර්ථවාදයයි'. එය හුදු නිර්දය විචාරයක් විය. රුසියන් ලේඛකයන් වන ගොගොල්, ඩොස්ටොව්ස්කි, ටොල්ස්ටෝයි ආදීහු මේ පෙළේ වූහ. ඔවුන් විශ්වාස කළේ කතාවකදී සියල්ල යථාර්ථයට අනුව විස්තර විය



ගේබ්‍රියල් ගාෂියා මාකේස්




යුතු බවය. 1917 සමාජවාදී සෝවියට් දේශය බිහිවීමත් සමඟ 'සමාජසත්තා යථාර්ථවාදී රීතිය' බිහිවිය. එය නව සමාජවාදී සමාජය උදෙසා නව මිනිසකු බිහිකිරීම ඉලක්ක කළ සාහිත්‍ය විචාර කලාවක් හා සාහිත්‍ය නිර්මාණ කලාවක් විය. එහිදී හුදෙකලා, තනි තනි වීරයන් වෙනුවට සාමුහික වීරයන් සහිත ජනතා අරගල සහිත කතාන්දර කලාවක් බිහිවිය. මෙම සටන් ජයග්‍රහණය කරන්නේ තනි මිනිසුන් නොවේ. සාමුහික මිනිස් ක්‍රියා විසින්ය. වැදගත්ම දේ හුදු විවේචනයෙන් එහා ගොස් පවතින ධනවාදය වෙනස් කරමින්, නව සමාජවාදී සාමුහික සමාජ පරිවර්තනයක අවශ්‍යතාව හා එම මෙහෙයුම ඉන් හුවාදැක්වීමයි. වත්මනෙහි සමාජවාදය නියෝජනය කරන්නේ මෙම කලා රීතියයි.

වඩ වඩාත් යල් පනිමින්, වඩ වඩාත් අර්බුදයට යමින්, වඩ වඩාත් සංකීර්ණ හා ජුගුප්සාජනක වන ධනේශ්වර සම්බන්ධතා ජාලය සාහිත්‍යමය වියමනකට එක් කරන්නට යථාර්ථවාදය වැනි සාහිත්‍ය ප්‍රවණතා ප්‍රමාණවත් නොවන්නට විය. සැබැවින්ම යථාර්ථවාදය බිහිවන්නේ ප්‍රංශ විප්ලවය අවධියේ රොමැන්ටික්වාදයට එරෙහිවය. යථාර්ථවාදය විසින් පෙන්වා දෙනු ලබන සමාජ යථාර්ථය ඉක්මවා ගිය ඉන්ද්‍රජාලික බවක් ධනවාදී සමාජ සම්බන්ධතා ක්‍රමයෙහි මතු වන්නට විය. කෲර, දුෂ්ට ධනවාදය තුළ පරාරෝපණයට ගොදුරුවූ මානව ශ්‍රමය මුහුණ දෙන බේදවාචකය වඩාත් තීව්‍ර කොට දක්වන්නට ඉන්ද්‍රජාලික මායා යථාර්ථවාදය නම් සාහිත්‍ය ප්‍රවණතාව බිහිවිය.

1925 ජර්මන් ජාතික කලා විචාරක ෆ්‍රාන්ස් රොව් (Franz Roh) විසින් 'මායා යථාර්ථවාදය' (Magical Realism) යන සාහිත්‍ය ප්‍රවණතාව මුල් වරට හඳුන්වා දෙන්නට විය. සැබැවින්ම ඔහු ඉදිරිපත් කළ දෙයෙහි වැඩි වශයෙන් වූයේ මායාකාරී බවයි. නමුත්, 1940න් පසු ලතින් ඇමෙරිකානු කලාපයේ ඇතිවූ ඉන්ද්‍රජාලික මායා යථාර්ථවාදය එයට වඩා ඉදිරියට ගොස් තිබිණ. එය යථාර්ථය හා (පැන්ටසියේ) මායාවන්ගේ පැහැදිලි දේශසීමා බොඳ කරන ලදී. යථාර්ථයද, මායාවද වෙන්ව ගත නොහැකි සේ බොඳ කළේය. පවතින යථාර්ථය මත මායාවන් ගොඩනඟන්නට විය. සැබැවින්ම මෙම සාහිත්‍ය ප්‍රවණතාව විශ්වීය වන්නේ ගේබ්‍රියල් ගාෂියා මාකේස් 1967දී රචිත 'සියක් වසක හුදෙකලාව (One Hundred Years of Solitude) කෘතිය නිසාවෙනි. ඔහු 'කොලරා කාලේ ආලේ' නමින් යථාර්ථවාදයෙන් ලියන ලද කෘතිය මෙරට ජනප්‍රිය විය. 'සියක් වසක හුදෙකලාව' මෙරට පාඨකයන් විසින් ග්‍රහණය කර ගනු ලැබීම සාපේක්ෂව අඩු නමුත්, එය ලෝකයේ මායා යථාර්ථවාදයේ විශිෂ්ට කෘතියකි. මෙම කලා ප්‍රවණතාවේ ව්‍යාප්තිය ලතින් ඇමෙරිකාව පුරා පැතිර ගියද, ආසියාව, අප්‍රිකාව තුළද මෙය ව්‍යාප්ත විය. මායා යථාර්ථවාදයේ වඩාත් කැපීපෙනෙන ලේඛක ගාර්ෂියා මාර්කේස් 1982දී සාහිත්‍යය සඳහා නොබෙල් ත්‍යාගය ලැබීය. මායා යථාර්ථවාදයේ ලේඛකයන් අතර මාර්කේස්ට අමතරව ලතින් ඇමෙරිකාවේ අලේහො කාපෙන්ටියර්, හුවාන් රුල්ෆෝ, ඉසබෙල් අයියන්දේ වැනි ලේඛක ලේඛිකාවන් ප්‍රමුඛ වේ. රුසියානු ලේඛක නිකොලායි ගොගොල්ද, මිහායිල් බුල්ග ාකෝෆ්ද, ජර්මානු ජාතික ෆ්‍රාන්ස් කෆ්කාද මායා යථාර්ථවාදී ලේඛකයන් ලෙස ප්‍රසිද්ධය. නොබෙල් ත්‍යාගලාභී ජර්මන් නවකතාකරු, ගුන්ට ග්‍රාස්, ඉන්දීය ලේඛක, සල්මන් රුෂ්ඩි,

07 පිටුව